# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2180/23 - 2020 ජුනි මස 17 වැනි බදාදා - 2020.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/2/3/10/2018.

බප/ගම්/පිටියේගෙදර ප්‍රාථමික විද්‍යාලය සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්/පරවශතාවේ විස්තර :*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 324/A, මුදුගමුව ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ මුඩගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම් 4194 දරන සැලැස්මේ සඳහන් ඉඩම් කොටස.

ඉඩමේ නම: අඹගහලන්ද; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10ක් පමණ වයසැති පොල්ගස් දහසයක්, අවුරුදු 20 ක් පමණ වයසැති කොස් ගස් දහතුනක් අවුරුදු 20 ක් පමණ වයසැති මැහෝගනි ගස් පහක් සහ අවුරුදු 20ක් පමණ වයසැති තේක්ක ගස් 06 ක් ඇත; හිමිකම් පාන්නා: ජයකොඩි ආරච්චිගේ දයාවතී; ප්‍රමාණය: හෙක්. 0.2942.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.07.03 වැනි දින පූ.භා. 10.00 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020.06.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ ගණන් බැලූ සැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනිකුත් ලියකියවිලිද පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුයි.

**එස්. පී. ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2020 ජුනි මස 03 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-87



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.